
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND
*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : **Daya Ananda Ranasinghe**
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## එදා පොසොන් සහ අද පොසොන්

**බු**දුරදුන් පිරිනිවන් පා වර්ෂ 236 ක් ගත වූ පොසොන් පුන් පොහෝදා දඹදිව ධර්මාශෝක අධිරාජයාගේ පුත් මහින්ද රහතන් වහන්සේ පිරිසක් හා ශ්‍රීලංකාවේ මිහින්තලා කඳු මුදුනේ අම්බස්තලයට වැඩමකර, එදින දඩයමේ ගිය දේවානම්පියතිස්ස රජුට සදහම් දෙසා ලක්දිව බුදුසසුන පිහිටවූ බව ඉතිහාසය පෙන්වා දෙයි.

පොසොන් පොහොයේ විශේෂ වැදගත්කම නම් ලංකාවේ ජනජීවිතය මුලුමනින්ම වෙනස් කළ දවස එදා වීමයි. එතැන් පටන් ලාංකික සංස්කෘතිය හා කලාශිල්ප බෞද්ධ පසුබිමක් තුළ වැඩී අවුත් සිංහල නම් අනන්‍යතාව ඇති විය. ලංකාවට සිංහල බෞද්ධ නමැති හැඳින්වීමේ තහඩුව ලැබුණේ ඉන්පසුව ය.

අහස උසට නැගුණු අනේක විහාරාරාම, දාගැබ් හා කැටයම් ආදි කලා ශිල්ප රටේ ජනතාවගේ මානසික සංහිඳියාවට උදව්වෙද්දි සාගරය පරදන වැව් අමුණු ඉදිවී රට බතින් බුලතින් සරුසාර වීය. ලංකාව පෙරදිග ධාන්‍යාගාරය නම් විරුදාවලිය ලැබී. මේ සියල්ලටම හේතුව බුදුදහමින් ලාංකීය ජනතාවට ලැබුණු නවජීවනයයි. ශක්තියයි. විධිමත් සංස්කෘතික පදනමක් බුදුදහම ඔස්සේ වැටුණු බැවින් ශ්‍රී ලංකාව වසර පන්සීයක් පමණ විවිධ විදේශික ආක්‍රමණයන්ට ගොදුරු වුනත්, පර සතුරන් වෙහෙර විහාර, දාගැබ් විනාශකරමින් රටේ මූලික සංස්කෘතිය නසාලීමට අපමණ මහන්සි ගත්තත් ඒ සියල්ල හමුවේ සිංහල බෞද්ධ පිටකොන්ද කැඩී ගියේ නැත.

එහෙත් ඕනෑම ශක්තිමත් ජාතියක් විනාශ කළ හැක්කේ කෙසේද? ඒ සඳහා විනාශය ඇතුළතින් ආරම්භ කළ යුතුය. අද දවස වන විට මේ මිහිතලයෙන් අතු ගෑවී යළි නොඑන්නටම වඳ වී ගිය ශිෂ්ටාචාරයෝ බොහෝ වෙති. ඒ සියල්ලම නැති හංගවී ගියේ පිටතින් ආ සතුරු ආක්‍රමණවලින් නොව ඒ ජනතාවන් තුමූම ඇතුළතින් තම විනාශය සළසාගත් බැවිනි. අද සිංහල බෞද්ධයා මුහුණදී සිටින්නේ සියතින් ම ගෙළ සිඳගැනීමේ ඒ කාර්යයටයි. ආර්ථික, සාමාජයික හා දේශපාලනික වශයෙන් සිංහලයාගේ කොන්ද කැඩී ඇත. පිටතින් ඔවුන්ට එරෙහිව බලවේග ක්‍රියාත්මක වනවිට එකමුතු වනු වෙනුවට ඇතුළතින් සිංහලයෝම පිල් බෙදී ඇන කොටා ගනිති.

ජාතියක් හැටියට සිංහලයාගේ විනාශය එසේ ශීඝ්‍රගාමීව සිදුවෙද්දි ආගමික වශයෙන් වන විනාශයද අති මහත්ය. පිටරටින් පැමිණ සිටින **NGO** කාරයෝ ලාංකික හෙංචයියන්ගේ ආධාර ඇතිව ලංකාවේ ඈත පිටිසර ගම් නියම්ගම් පීරමින් දිළිඳු ජනතාවට උදව්කරන නියායෙන් සල්ලි, කෑම බීම, රෙදි පිළි බෙදා දෙමින් බෞද්ධ ජනයා ආගමට හැරවීමේ කාර්යයේ යෙදී සිටිති. කොටින්ම දඹානේ වැදි ජනතාවගේ කරේද කුරුස එල්ලා ඇත.

මේ නිවට තත්වයෙන් ගොඩඒමට නම් සිංහළයින් එකමුතුව එමෙන් ම බුද්ධිමත්ව සංවිධාන විය යුතුව ඇත. පෞඪ අතීතයක් අපට තිබුණු බව සැබෑ ය. එහෙත් ඒ ගැන උදම්වෙමින් කතාකර කර සිටියාට වැඩක් නොවේ. වහා ක්‍රියාකාරීව විනාසය වළක්වා ගතයුතුය. සිංහළයා නින්දෙන් අවදිවිය යුතුය.

# පොසොන් මහ මහිමය



**නි**රුක්ති අර්ථ අනුව පොසොන් මහ මහිමය යනු මහා මල් මහිමයයි. එම මාසය එලෙස නම්කර ඇත්තේ ඒ මාසයේ ඇදවැටෙන හිරිපොද මල් වැහි නිමිතිකරගෙනයි. මෙබඳු කාලගුණික මල් වැහිවල පමණක් නොව අධ්‍යාත්මික මල් වැහි වල සම්බන්ධතාවක්ද පොසොන් මාසයට තිබේ.

පොසොන් යන්න මල් යන අරුත දෙන ප්‍රසූන නම් සංස්කෘත වචනයෙන් සිංහල යට බිඳී ආවකි. මල් යන එම අරුතින් පොසොන් යන වචනය අනුරාධපුර යුග යේදී රචිත, 10 වන ශතවර්ෂයට අයත් පැරණිම සිංහල ගද්‍ය ග්‍රන්ථය වන දම්පියා අටුවා ගැටපදයෙහිද, පොළොන් නරු යුගයේදී රචිත, 12 වන ශතවර්ෂ යට අයත් කංකාවිතරණයෙහිද, දඹදෙණි යුගයේදී රචිත, 13 වන ශතවර්ෂයට අයත් පැරණිම සිංහළ ව්‍යාකරණ ග්‍රන්ථය වන සිදත් සඟරාවෙහි ද, කෝට්ටේ යුගයේදී රචිත, 15 වන ශතවර්ෂයට අයත් පුරාණ නාමා වලියෙහිද යෙදී ඇත.

පොසොන් මහේදී සිරිලකට අහසින් ඇදවැටෙන මල් වැහි නමැති දුවන හිරි පොද වැහි අදත් ඇද වැටේ. සිරිලකට පොසොන් පුරපසළොස්වක් පෝ දිනක අසිරිමත් අධ්‍යාත්මික මල්වැසි වැසීම ආරම්භ වූයේ ක්‍රි.පූ. 247 දී මිහින්තලාවේ මිස්සක පව්ව මත අනුබුදු මාහිමියන් සහ ශ්‍රීලංකාධිපති දේවානම් පිය තිස්ස නරනිඳුන් එකට මුණගැසීමත් සමගය.

අධ්‍යාත්මික මල්වැස්ස යනු අධ්‍යාත්මිකව උදාවිය හැකි පරම සෞන්දර්යය හා ප්‍රබෝධය පහළවීමය. මිහිපිට පහළවන පරම සෞන්දර්යයේ සහ ප්‍රබෝධයේ සංකේතය නොහොත් සළකුණද මල්ය. මහපොළවෙන් ද, වැසිදියෙන් ද, හිරු එළියෙන් ද, වායුගෝලයෙන් ද උරාගත හැකි පරම සාරයේ රමණීය තම නිර්මාණය මල් ය.

මිහිඳු මා හිමියන් සිරිලකට ගෙන ආවේ ලක්වැසියන්ගේ සිත්සතන් අධ්‍යාත්මිකව ප්‍රබෝධයට පත්කරවන සදහම් මල්වැස්සකි. සම්බුදු හිමියන් මුළු ලොවට ගෙන ආවේ ලක්‍ෂ ගණන් විනෙය ජනයන් මෙන්ම, දසදහසක් සක්වල දෙව් බඹුන්ද පුබුදුකරවන මහාමේඝ සද්ධර්ම වර්ෂාවකි. ඒ හා සසඳන කල අනුබුදු හිමියන් ගෙන ආවේ සදහම් සිරිපොද වැස්සක් නොහොත් මල්වැස්සකි.

ශ්‍රීලංකාවේ පාරම්පරික ඇදහිලි අනුව මල්වැහි පිළිගනු ලබන්නේ ලංකාරක්‍ෂක ශාසනාරක්‍ෂක දෙවිදේවතාවුන්ගේ දේවාශීර්වාදයක පෙරනිමිති ලෙසය. එම දෙවියන්ට මිහිතලයට බැසීම සඳහා අහස්තලය පිරිසිදුකිරීමක් ලෙසය. අවුරුදු දෙදහසකට අධික කාලයක් තිස්සේ මිහිඳු මාහිමියන්ගේ සදහම් පණිවුඩය සිරිලක නොනැසී පවතින්නේ එම දේවාශීර්වාදයෙන් බව පාරම්පරික විශ්වාසයයි.

මිනිසුන්ට දේවාශීර්වාදය ලැබෙන්නේ මිනිස් හදවත් පින්බර වූ කල්හිය. මිනිසුන් පින්කර දෙවියන්ට පින්දෙන විටය. මිහිඳු මා හිමියන්ගේ ප්‍රථම මහජන දේශනාවලින් සිදුවූයේ මිනිස් හදවත් තුළ පව්මල සෝදා පිරිසිදු කොට පින් මල් පුබුදුවීමය. උන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව වන පෙතවත්ථු මගින් කියැවෙන්නේ පව් කරන අය අපාගතවී දුක් විඳින සැටිය. ඊළඟට දේශිත විමානවත්ථු වලින් කියැවෙන්නේ පින් කළ අය දිව්‍ය සම්පත් විඳින සැටිය. ලෝභ ද්වේශ මෝහ පදනම් කරගත් අකුසල කර්මයන්ගෙන් සිදු වන්නේ අප තුළ අපා දුක් මැවීමය. අලොභ, අදොස, අමොහ පාදක කුසලකර්ම යන්ගෙන් සිදුවන්නේ දිව්‍ය සම්පත් මැවීම ය.

මිහිඳු හිමියන්ගේ මුල් දේශනාවලින් පොදුජනයාට කියැවුණේ බුදුදහම අනුව පින්මල් පුබුදුවාගෙන මිනිස් සිත්සතන්හි දිව්‍යලොක මවාගත හැකි ආකාරයයි. එසේ දිවමල් පිපෙන බලය අප හැම කෙනෙකු තුළම ඇත.

මලක අන්තර්ගතය වන්නේ ගසක වැලක සැඟවී ඇති මිහිරි සුවඳ, පැණිරසය, මුදු මොළොක්බව හා වර්ණ සෞන්දර්‍යයයි. අප තුළ සැඟවී ඇති ගුණ යහපත්කම් අවදිකර ගැනීම එවැනි සුවඳැති සුමිහිරි සුමට මල් පිබිදීමක් බඳුය. පොසොන් මහිමය යනු ඒ මල්මහිමයයි.

ගසක හෝ වැලක මල් පිබිදෙන්නේ ඒ ගස්වැල් කාලානුරූපව වර්ධනය වී, හැදී වැඩී මෝරා පරිණතව මල් පිපෙන අවධියට ළඟාවූ පසුය. සංසාරයේ සරන සෑම සත්වයෙකුම කෙදිනක හෝ සසර දුකෙන් මිදී නිවන්මග දකින්නේ ඒ සඳහා අවශ්‍යවන හේතු සම්පත් මෝරාගිය විටය. ආලවකයන්, අංගුලිමාලයන් වැනි දරුණු මිනීමරුවන්ට ද නිවන දැකිය හැකිවූයේ ඒ සඳහා අවශ්‍ය හේතු සම්පත් මෝරා තිබුණු හෙයිනි. ලොව්තුරා බුදුවරයෙකුගේ ඇසුර ලැබුණද චුන්දසූකර, අජාසත්ත, දේවදත්ත, චිංචිමානවිකා වැන්නවුන් අපාගත වූයේ හේතු සම්පත් නොතිබුණු හෙයිනි.

වසන්තය උදාවී හිරුඑළියෙන් නැහැවුනත් අවශ්‍ය පමණට නොමේරූ ගස්වල මල් නොපිපේ. මල්මහිමය නොහොත් පොසොන් මහිමය පළ නොවේ. එසේම පින්ඵල නොමේරූ සිත්වල ද පොසොන් මහිමය පළ නොවේ.

♦ *සම්මානිත මහාචාර්‍ය ටී. එස්. අබේවික්‍රම* **Harrow UK**

## Root of All Problems

Man's inability to control and discipline his mind is responsible for all his problems. Material progress, though often of immense benefit, is no substitute for the age-old spiritual values that have shaped the civilizations of the world.

♦ **Most Ven. Dalai Lama**

## සියළු ප්‍රශ්නවලට මූල

මිනිසාගේ සියළු ගැටළු වලට හේතුව ඔහුට තම සිත පාලනයකොට හික්මවා ගන්නට නොහැකි වීමයි. ලෞකික සැප සම්පත් වලින් දියුණුවීම බොහෝ විට ඔහුට විශාල ප්‍රයෝජනයක් වුවද, ඒවා සමස්ථ ලෝකයේම ශිෂ්ඨාචාරය මනා ලෙස සකස් කිරීමට ඉවහල් වූ, පුරාතනයේ පටන් පැවතඑන අධ්‍යාත්මික වටිනාකම් හා කිසිසේත් සමාන කළ හැකි නොවේ.

♦ *අති පූජ්‍ය දලයි ලාමා වහන්සේ*

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතොපදේශයෙන්

**ගච්ඡතස් ස්ඛලනං යාති - පදමුද්වහනි පණ්ඩිත:**
**හසනති දුර්ජනා: තත්‍ර - සමාදධති සජ්ජනා:**

***අර්ථය** : යමෙකු පිය මනින විට පය පැකිලිල්ලට දුදනෝ සිනහ වෙති. නමුත් සත් පුරුෂයෝ සහන දෙති.*

**ස**මාජ සදාචාරය, මනුෂ්‍ය සභ්‍යත්වය ආදී සමාජ සාරධර්ම සුරකින සුදනන් හා සමාජ වටිනාකම් නොහඳුනන, ඒවා කෙලෙසන, සමාජ පිළිල ලෙස සලකන දුදනන් යන දෙයාකාර පුද්ගලයින්ගේ ගති ලක්‍ෂණ වලින් දෙකක් මෙම පද්‍යයෙන් විස්තර කොට ඇත.


අප ජීවත්වන සමාජය අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ සමාජ ජාලයක් වශයෙන් පවතී. මෙම සම්බන්ධතාව යම් තැනෙකින් ලිහිල්ව ගියහොත් සමස්ථ සමාජ තලයම දෙදරායාමට පත් වේ.

අප හැමදෙනම සමාජගත පුද්ගලයන් නිසා එකිනෙකා මත යැපීමේ ස්වභාවයක් අප අතර පවතී. අන් අය අමතක කර දමා හුදෙකලා ජීවිතයක් ගතකිරීමේ හැකියාවක් අපට නැත. එසේ කරනවා නම් කළ හැක්කේ යම් ගැටළුවක් පැන නගින තෙක් පමණි. ඉන්පසුව අන් අයගේ උදව් උපකාර අනිවාර්යයෙන්ම ලබාගත යුතු වන්නේය. උදාහරණයක් ලෙස, නිරෝගීව සිටින තාක්කල් කෙනෙකුට බෙහෙත් ආදී වෛද්‍ය උපකාර අවශ්‍ය නොවේ. එහෙත් රෝගී වූ සැණින් ඒවායේ පිහිට පැතීමට සිදුවේ. කෙනෙකු රෝගී නොවන්නේයයි සහතික කිරීමට නොහැකිය.

කුඩා කාලයේ දෙමාපියන්ගෙන් පටන්ගෙන සොයුරු සොයුරියන්, නෑදෑ හිතමිතුරන්, සේවක සේවිකාවන්, ගුරු සිසුන් ආදී වශයෙන් අපි එකිනෙකා හා සම්බන්ධව ජීවත්වන්නෝ වෙමු. ළදරු කාලය හා වැඩිමහළු තත්වයට පත් වූ කාලය අන්‍යයන්ගේ කරුණාව, රැකවරණය උදව් උපකාර ලබා ගැනීමට සිදුවන අතර ඒ අතරතුර කාලය අප විසින් ද අනුනට කරුණාව, රැකවරණය හා උදව් උපකාර ලබාදීමට දීමට යුහුසුළු විය යුතුය.

වරදින මිනිසාට හිනාවීම සමාජයේ බහුලව දක්නට ලැබෙන දෙයකි. තමාගේ වැරදීම සඟවාගෙන අනුන් දෙස විපරමින් බලාසිටින්නේ හිනාවීමටය. වැටෙන මිනිසෙකුට අතදීමට ඉදිරිපත්වන්නේ කලාතුරකිනි. බොහෝ අය කල්පනා කරන්නේ වැටෙන මිනිසා නොනැගිටින ලෙස තවත් පාගා තැබීමටය. අනුන් මුළාකොට විපතේ හෙළා, පහළට ඇද දමන්නට වෙර දරණ අය බහුලය.

නමුත් සත්පුරුෂයාගේ සිත එසේ නොවේ. වැටෙන මිනිසාට හිනාවීම පිළිකුල් කොට ඔහුට අතදීම සත්පුරුෂ ගුණයයි. කරදරයට පත් මිනිසා ඉන් ගොඩගැනීම ඔහුගේ පරම අභිලාෂයයි. වැරදීම, ඇදවැටීම, කටයුතු අඩාලවීම ලෝක ස්වභාවයයි. ඉන් මිදීමට සත්පුරුෂයා උපදෙස් දෙයි. ගොඩ ඒමට අත දෙයි. සෙනෙහසින් මාර්ගෝපදේශය ලබාදෙන සත්පුරුෂයෝ පරිශ්‍රමයන් හි සෙවනැල්ලක් මෙන් නිබඳ ළඟ සිටිති. සත්පුරුෂයින්ගේ ස්වභාවය එලෙස ය.



♦ ***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***

**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue,**
**London W4 1UD**

**ANOOMA & HEGODA Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 0 2 0 8 3 4 8 7 7 7 2

**Work Permits and Highly Skilled Migrant Applications done.**
**We also deal with visa refusal from British High Commission in Colombo**

Colombo Office
**Hegoda & Hegoda**
100/6 Rosemead Place, Colombo 7
Tel. 2672432 / 0777686632